සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

තෙවන වාර පරීක්ෂණය 2021
**Third Term Test**

13 ශ්‍රේණිය
**Grade 13**

ගිණුම්කරණය - I

පැය 2

# I කොටස

**උපදෙස් :**

- **ප්‍රශ්න අංක 01 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
- **ප්‍රශ්න අංක 31 - 50 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

01. කළමණාකරණ ගිණුම්කරණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

A - ගිණුම්කරණ සංකල්ප හා ප්‍රමිත යොදා ගනියි.
B - අතීත හා පුරෝකථන තොරතුරු යොදා ගනියි.
C - අභ්‍යන්තර පාර්ශවයන්ට පමණක් තොරතුරු ඉදිරිපත් කරයි.

1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. B හා C පමණි.
5. A හා B පමණි. (..........)

02. 2020 ජනවාරි මස ව්‍යාපාරයක සිදු වූ ගණුදෙනු පහත පරිදි විය.

2020.01.18 - පිරිවැය රු.40 000 ක තොගයක් රු.90 000 ට ණයට විකිණීම.
2020.01.22 - පිරිවැය රු.2 000 ක තොග ආපසු එවීම. ඒවායේ විකුණුම් මිල රු.5 000 කි.
2020.01.31 - 10% ක මුදල් වට්ටමකට යටත්ව අයවිය යුතු මුදල් ලැබී ඇත.
2020.01.31 දිනට නිවැරදි ගිණුම්කරණ සමීකරණය වන්නේ,

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| 1. | - 85 000 | = | - 8 500 | - | 76 500 |
| 2. | + 38 500 | = | + 38 500 | + | 0 |
| 3. | + 50 000 | = | + 50 000 | + | 0 |
| 4. | + 85 000 | = | + 8 500 | + | 76 500 |
| 5. | - 3 000 | = | - 3 000 | + | 0 |

(..........)

03. පහත සඳහන් වන්නේ සාතේෂ්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගණුදෙනු කිහිපයකි.

| | හිමිකම් | + | වගකීම් | = | වත්කම් |
|---|---|---|---|---|---|
| 1. | + 20 000 | | | = | + 20 000 |
| 2. | | + | 15 000 | = | + 15 000 |
| 3. | + 4 000 | - | 2 000 | = | + 2 000 |

- අංක 01 ගණුදෙනුව පමණක් ලාභයට බලපෑම් ඇති කරයි.
- ආරම්භක ප්‍රාග්ධනය රු.300 000 කි.

පහත කුමන සමීකරණය මගින් නිවැරදි ශුද්ධ ලාභය ගණනය වේද?

1. ශුද්ධ ලාභය = 320 000 - 300 000 + 4 000
2. ශුද්ධ ලාභය = 324 000 - 300 000 + 4 000
3. ශුද්ධ ලාභය = 320 000 - 300 000
4. ශුද්ධ ලාභය = 324 000 - 300 000 - 4 000
5. ශුද්ධ ලාභය = 320 000 - 300 000 - 4 000 (..........)



SPEDEXAM2021
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

04. පහත ගිණුම් වර්ග සඳහා නිවැරදි ගැලපීම වනුයේ,

| | |
|---|---|
| 1 - වත්කම් | A - ගෙවිය යුතු විදුලිය |
| 2 - වගකීම් | B - රඳවාගත් ඉපයුම් |
| 3 - හිමිකම් | C - හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම් |

1. 1- B, 2- A, 3- C
2. 1- C, 2- A, 3- B
3. 1- B, 2- C, 3- A
4. 1- A, 2- B, 3- C
5. 1- C, 2- B, 3- A (……….)

- 05 හා 06 ප්‍රශ්න සඳහා පහත තොරතුරු අදාළ වේ.

තරුෂිගේ ව්‍යාපාරය 2020 මාර්තු මස නිසලිගේ ව්‍යාපාරයෙන් රු. 500 000 ක් වටිනා තොග ණයට ගන්නා ලදි. ඉන් රු. 10 000 ක තොග හානි වී තිබූ නිසා ආපසු යවන ලද අතර ගෙවිය යුතු මුදල ගෙවන ලදි.

05. ඉහත ගණුදෙනු වලට අදාලව තරුෂිගේ ව්‍යාපාරයේ භාවිතා කළ මූලාශ්‍ර ලේඛන වන්නේ,

1. ඉන්වොයිසිය, බැරපත , ගෙවීම් වවුචරය
2. ගෙවීම් වවුචරය, හරපත, ලදුපත
3. ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය
4. ගෙවීම් වවුචරය, බැරපත, ලදුපත
5. ඉන්වොයිසිය, හරපත, ජ'නල් වවුචරය (……….)

06. නිසලිගේ ව්‍යාපාරයේ ඉහත ගණුදෙනු වාර්තා කිරීමට භාවිතා කරන මූලික පොත් වන්නේ,

1. විකුණුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය
2. ගැනුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය
3. විකුණුම් ජ'නලය, ආපසු යැවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය
4. ගැනුම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ගෙවීම් ජ'නලය
5. මුදල් ගෙවීම් ජ'නලය, ආපසු එවුම් ජ'නලය, මුදල් ලැබීම් ජ'නලය (……….)

- 07 හා 08 ප්‍රශ්න සඳහා පහත තොරතුරු අදාළ වේ.

සී/ස නදුවර පොදු සමාගමේ 2020 මාර්තු මාසය සඳහා පිළියෙල කළ මුදල් පාලන ගිණුමේ ශේෂය හා බැංකු ප්‍රකාශයේ ශේෂය සමාන නොවූ අතර පහත තොරතුරු ඔබට සපයා ඇත. 2020/03/31 දිනට පිළියෙල කරන ලද මුදල් පාලන ගිණුමේ ශේෂය රු. 15 000 කි.

| | මුදල් පාලන ගිණුම | බැංකු ප්‍රකාශය අනුව |
|---|---|---|
| ▪ තැන්පතු | 78 000 | 59 000 |
| ගෙවීම් | 80 000 | 72 000 |

- මුදල් පාලන ගිණුමේ හා බැංකු ප්‍රකාශයේ මාසය මුල ශේෂ සමාන වී ඇත.
- බැංකු ප්‍රකාශයේ ගෙවීම් තුල ඇතුළත් 6 000 ක ගෙවීම් හා තැන්පතු තුළ ඇතුළත් 9 000 ක තැන්පතු මුදල් පාලන ගිණුමේ සටහන් නොවූ ඒවාය.

07. 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වන මුදල් ශේෂය වන්නේ,

1. රු. 18 000
2. රු. 15 000
3. රු. 24 000
4. රු. 13 000
5. රු. 2 000 (……….)

08. 2020/03/31 ට බැංකු ප්‍රකාශය අනුව බැංකු ශේෂය වන්නේ,

1. රු. 18 000
2. රු. 10 000
3. රු. 20 000
4. රු. 15 000
5. රු. 29 000 (……….)

SPEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

09. බුද්ධිමගේ ව්‍යාපාරයේ 2020/10/30 දිනට සුළු මුදල් ගිණුමේ ශේෂය රු.1 600 ක් ව පැවති අතර 2020/11/01 දින සුළු මුදල් අග්‍රීමය ප්‍රතිපූර්ණය කරන ලදි. 2020 ඔක්තෝබර් මස සුළු මුදල් ගෙවීම් වල එකතුව රු.5 400 ක් විය. 2020/11/30 දින සුළු මුදල් භාරකරු සතුව රු.2 400 ක් පැවතුනි. සුළු මුදල් අග්‍රීමය හා 2020 නොවැම්බර් මස සුළු මුදල් ගෙවීම් වටිනාකම කීයද?

| | සුළු මුදල් අග්‍රීමය (රු.) | සුළු මුදල් ගෙවීම් වටිනාකම (රු.) |
|---|---|---|
| 1. | 4 000 | 5 400 |
| 2. | 4 000 | 1 600 |
| 3. | 7 000 | 3 600 |
| 4. | 7 000 | 5 400 |
| 5. | 8 000 | 2 400 |

(..........)

10. ප්‍රසාද්ගේ ව්‍යාපරයේ වර්ෂය අවසාන ශේෂ පිරික්සුම තුලනය නොවූ නිසා වෙනස අවිනිශ්චිත ගිණුමකට ගෙන යන ලදි. ව්‍යාපාරයේ පාලන ගිණුම් පවත්වා ගෙන යන අතර පහත වැරදි සොයාගෙන ඇත.

(අ) රු. 10 250 ක අත්පිට විකුණුම් ගිණුම් වල සටහන් කර තිබුණේ 12 050 ක් ලෙසය.

(ආ) උපලෙජරයේ A. පෙරේරාගෙන් භාණ්ඩ මිලට ගැනීම රු. 10 000 B. පෙරේරාගේ ගිණුමට පිටපත් කර තිබුණි.

(ඉ) විවිධ වියදම් 1 500 ක් ශේෂ පිරික්සුමෙන් අත්හැරී තිබුණි.

වැරදි නිවැරදි කිරීමට පෙර පොදු ලෙජරයේ අවිනිශ්චිත ගිණුමේ ශේෂය කොපමණද?

1. 300 - බැර
2. 300 - හර
3. 11 800 - හර
4. 1 500 - හර
5. 1 500 - බැර

(..........)

11. පහත වැරදි අතරින් ශේෂ පිරිසුමකින් අනාවරණය වන වැරදි වන්නේ,

A - ලද කොමිස් රු. 10 000 මුදල් ගිණුමට හර කර ගෙවූ කොමිස් ගිණුමට හර කිරීම.
B - දුරකතන සඳහා ගෙවූ රු.3 000 ක දුරකතන ගිණුමේ 5 000 ක් ලෙස සටහන් වීම.
C - ණයහිමි පාලන ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමේ අඩුවෙන් ලියා තිබීම.

1. A පමණි.
2. B පමණි.
3. A හා B පමණි.
4. A හා C පමණි.
5. A, B, C සියල්ලම.

(..........)

12. ව්‍යාපාරයක අයිතිකරුවකු තම පුද්ගලික ප්‍රයෝජනය සඳහා විකිණීමට තිබූ බඩු රැගෙන ගිය විට එය ගැනුම් වලින් අඩුකර විකුණුම් පිරිවැය සෙවීමට පදනම් වන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. අඛණ්ඩ පැවැත්ම සංකල්පය
2. සංගතතා සංකල්පය
3. ඒකක සංකල්පය
4. ගැලපුම් සංකල්පය
5. උපචිත සංකල්පය

(..........)

13. ව්‍යාපාරයක් තමන්ගේ ඉතා දක්ෂ සේවකයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණහොත් ඉන් කඩවන ගිණුම්කරණ සංකල්පය වන්නේ,

1. යථානුරූපී සංකල්පය
2. ප්‍රමාණාත්මකභවේ සංකල්පය
3. හෙළිදරව් කිරීමේ සංකල්පය
4. මූල්‍ය මිනුම් සංකල්පය
5. ඒකක සංකල්පය

(..........)

14. ක්ෂය කළ හැකි වත්කම් වල ක්ෂය අගයන් වියදමක් ලෙසත්, වත්කමේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ධාරණ අගයට පෙන්වීමටත් අදාළ වන ගිණුම්කරණ සංකල්ප පිළිවෙළින් නම් කර ඇත්තේ,

1. ආරක්ෂණ හා ගැලපුම් සංකල්පය
2. ගැලපුම් හා උපචිත සංකල්පය
3. උපචිත හා ගැලපුම් සංකල්පය
4. අඛණ්ඩ පැවැත්ම හා ආරක්ෂණ සංකල්පය
5. ගැලපුම් හා ආරක්ෂණ සංකල්පය

(..........)



SPEDEXAM2021
iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

15. 2019 හා 2020 වර්ෂයන් සඳහා ආයතනයක් ගෙවල් කුලී ලෙස පිළිවෙළින් රු. 480 000 ක් හා 600 000 ක් ගෙවා තිබුණි. ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය සෑම වසරකම මාර්තු 31 න් අවසන් වේ. 2020/03/31 න් අවසන් වර්ෂයට ආදායම් ප්‍රකාශයට මාරු කළ යුතු කුලී වියදම හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතු ඉදිරියට ගෙවූ කුලී වියදම වන්නේ,

| | ආදායම් ප්‍රකාශයට (රු.) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට (රු.) |
|---|---|---|
| 1. | 600 000 | 480 000 |
| 2. | 570 000 | 30 000 |
| 3. | 570 000 | 510 000 |
| 4. | 510 000 | 450 000 |
| 5. | 510 000 | 570 000 |

(..........)

16. රිෂිනිගේ ව්‍යාපාරයෙන් පහත තොරතුරු උපුටාගෙන ඇත.

- 2019/04/01 හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම් 4 800
- වර්ෂය තුළදී කපාහල හානිකරන අලාභ 1 600
- පෙර වර්ෂය වෙනුවෙන් කපාහල හානිකරණ අලාභ නැවත ලැබීම 800
- 2020/03/31 ට වෙළෙඳ ලැබිය යුතු දෑ රු.90 000 කි.
- වසර අග වෙළෙඳ ලැබිය යුතු දෑ මත 5% ක් හානිකරන අලාභ සඳහා ඉඩහැරීම් කිරීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ.

පහත දෑ සොයන්න.

| | හානිකරන අලාභ වියදම (රු.) | වෙළෙඳ ලැබිය යුතු දෑ වල ධාරණ අගය (රු.) |
|---|---|---|
| 1. | 500 | 90 000 |
| 2. | 500 | 85 500 |
| 3. | 6 100 | 90 000 |
| 4. | 4 500 | 85 500 |
| 5. | 85 500 | 500 |

(..........)

17. ව්‍යාපාරයක ආරම්භක තොගය රු. 50 000 කින් වැඩියෙන් තක්සේරු වී තිබූ අතර අවසන් තොග ශේෂය රු. 60 000 කින් අඩුවෙන් තක්සේරු වී ඇත. මෙම වැරදි නිසා දළ ලාභය කෙරෙහි සිදු කරන බලපෑම වන්නේ,

1. දළ ලාභය රු. 10 000 කින් වැඩියෙන් සටහන් වීමයි.
2. දළ ලාභය රු. 10 000 කින් අඩුවෙන් සටහන් වීමයි.
3. දළ ලාභය රු. 110 000 කින් වැඩියෙන් සටහන් වීමයි.
4. දළ ලාභය රු. 110 000 කින් අඩුවෙන් සටහන් වීමයි.
5. දළ ලාභය රු. 60 000 කින් අඩුවෙන් සටහන් වීමය. (..........)

18. සචිත්ගේ ව්‍යාපාරයේ තොග අයිතම 03 ක් සඳහා 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| අයිතමය | පිරිවැය | අපේක්ෂිත විකුණුම් මිල | අපේක්ෂිත විකුණුම් වියදම් |
|---|---|---|---|
| A | 20 000 | 18 000 | 2 000 |
| B | 18 000 | 20 000 | 4 000 |
| C | 22 000 | 25 000 | 2 000 |

කාණ්ඩ ක්‍රමය අනුව 2020/03/31 දිනට තොග වත්කමේ අගය වන්නේ,

1. රු. 60 000
2. රු. 63 000
3. රු. 55 000
4. රු. 7 000
5. රු. 3 000

(..........)



SPEEXAM2021
iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

19. නදුවර සමාගමේ VAT සඳහා ලියාපදිංචි වූ සමාගමකි. 2020/03/31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු දී ඇත. සියලු ගැනුම් හා විකුණුම් මුදලට සිදුවේ. VAT අනුපාතය 8% කි.

| | | |
|---|---|---|
| - 2019/04/01 ට VAT වගකීම | - | 4 800 |
| - විකුණුම් මත එකතු කළ අගය මත බදු | - | 19 200 |
| - ගැනුම් මත එකතු කළ අගය මත බදු | - | 12 000 |
| - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවූ VAT | - | 6 000 |
| - 2020/03/31 ට VAT වගකීම කොපමණද? | - | ? |

1. රු. 1 200
2. රු. 24 000
3. රු. 12 000
4. රු. 4 800
5. රු. 6 000

(……….)

20. "සඳතරු" ක්‍රීඩා සමාජයේ 2020/03/31 දිනට පහත තොරතුරු සපයා ඇත.

සාමාජික මුදල් ආදායම - රු. 800 000
ආපනශාලා විකුණුම් - රු. 1 000 000

ආපනශාලා විකුණුම් සිදුකරනුයේ විකුණුම් මිලට 20% ක දළ ලාභ ප්‍රතිශතයකටය. ආපනශාලා වෙනත් වියදම් ආපනශාලා දළ ලාභයෙන් 25% කි. ක්‍රීඩා සමාජයේ අනෙකුත් වියදම් 420 000 කි.

පහත දෑ සොයන්න.

| | 2020/03/31 වර්ශයේ ආපනශාලා ශුද්ධ ලාභය (රු.) | සංවිධානයේ අතිරික්තය/ ඌණතාවය (රු.) |
|---|---|---|
| 1. | 200 000 | 950 000 |
| 2. | 950 000 | 800 000 |
| 3. | 150 000 | 530 000 |
| 4. | 200 000 | 380 000 |
| 5. | 380 000 | 950 000 |

(……….)

21. පහත ප්‍රකාශයන්ගෙන් කුමන ප්‍රකාශය දේපල පිරියත උපකරණ ක්ෂය කිරීම සම්බන්ධයෙන් අසත්‍යවේද?

1. වත්කම් ක්ෂය කිරීම ආරම්භ කල යුතුවන්නේ එම වත්කම් ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්වන අවස්ථාවේ සිටය.
2. අවම වශයෙන් සෑම මූලය වර්ෂයක් අවසානයේදීම මූල්‍ය වත්කම්වල ඵලදායී ජීව කාලය සමාලෝචනය කල යුතුය.
3. ක්ෂය කිරීම යනු වත්කමේ ක්ෂය කළ හැකි අගය එහි ඵලදායී ජීව කාලය තුළ ක්‍රමානුකූලව බෙදා හැරීමයි.
4. ක්ෂය ක්‍රමය තුලින් වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂා කරන ආකාරය පිළිඹිබු විය යුතුය.
5. ක්ෂය වෙනත් වත්කමක ධාරණ අගය තුලට ඇතුලත් වේ. නම් එය වත්කමක් නොව වියදමක් වේ.

(……….)

22. කලූ හා සුදූ සම සමව ලාභ බෙදාගත් හවුල් ව්‍යාපාරයට 2019/04/01 දින ලාභයෙන් $\frac{1}{3}$ ක කොටසකට හා රු. 10 000 ක මාසික වේතනයකට රතු බඳවා ගන්නා ලදි. 2020/03/31 න් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 1 020 000 ක ලාභයක් උපයන ලදි. 2020/03/31 දිනෙන් අවසන් වසර සඳහා කලූ හා රතු හවුල් ව්‍යාපාරයෙන් ලබාගත් ආදායම් වනුයේ,

| | කලූ | රතු |
|---|---|---|
| 1. | රු. 300 000 | රු. 120 000 |
| 2. | රු. 340 000 | රු. 340 000 |
| 3. | රු. 0 | රු. 120 000 |
| 4. | රු. 300 000 | රු. 420 000 |
| 5. | රු. 340 000 | රු. 120 000 |

(……….)



SPEDEXAM2021
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

23. පහත දෑ අතරින් ගිණුම්කරණ ඇස්තමේන්තුවකට උදාහරණයක් නොවන්නේ කුමක්ද?

1. වත්කමක ඵලදායී ජීව කාලය
2. වගකීම් සහතික සඳහා වෙන් කිරීම්
3. හානිකරණ අලාභ සඳහා ඉඩ හැරීම්
4. යන්ත්‍රයක සුන්බුන් අගය
5. බරිත සාමාන්‍ය මිල ක්‍රමයට ගණනය කල තොගයේ පිරිවැය (……….)

24. ව්‍යාපාරයක් 2019/04/01 දින මිලට ගත් මෝටර් රථයක ඵලදායී ජීව කාලය වසර 10 ක් ද පිරිවැය 220 000 ක් ද සුන්බුන් අගය 20 000 ක් ද විය. 2019/10/01 දින මෝටර් රථය රු. 260 000 වැය කර වායු සමනය කල අතර එදින සිට නව ඵලදායී ජීව කාලය වසර 15 කි. සුන්බුන් අගය එලෙසම පවතී. 2020/03/31 දිනට වත්කමේ ධාරණ අගය වනුයේ,

1. රු. 450 000
2. රු. 455 000
3. රු. 190 000
4. රු. 20 000
5. රු. 25 000 (……….)

25. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුව තුල මූල්‍ය ප්‍රකාශයන්ට අදාළව හඳුනාගත හැකි වැඩිදියුණු කිරීමේ ගුණාත්මක ලක්ෂණයක් නොවන්නේ,

1. අවබෝධකර ගත හැකි බව
2. කාලානුරූපී බව
3. සැසඳිය හැකි බව
4. සත්‍යාපනය කල හැකි බව
5. අදාළ බව (……….)

26. ලී බඩු නිෂ්පාදන සමාගමක් තම අපවිත්‍ර ද්‍රව්‍ය අසල ඉඩමකට බැහැර කර ඇත. මෙම ඉඩම පිරිසිදු කිරීම සඳහා රුපියල් මිලියන 10 ක් වැයවෙතැයි ඇස්තමේන්තු කර ඇත. මේ සඳහා වෙන් කිරීමක් සිදු කිරීමට සම්පූර්ණ කළ යුතු නිර්ණායක වන්නේ,

A - වටිනාකම විශ්වාස ලෙස ඇස්තමේන්තු කළ හැකි වීම.
B - අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වීම.
C - බැඳීම නිදහස් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායාමේ හව්‍යතාවක් තිබීම.

1. A හා B පමණි.
2. B හා C පමණි.
3. A පමණි.
4. A හා C පමණි.
5. A, B, C සියල්ලම. (……….)

27. තරංගගේ ව්‍යාපාරයේ 2019/13/01 දිනට එකක් රු. 1 000 බැගින් මිලට ගත් භාණ්ඩ 10 ක් පැවති අතර 2019 දෙසැම්බර් මස මිලට ගත් භාණ්ඩ වල මුළු පිරිවැය රු. 120 000 ක් විය. 2019/12/31 එකක් රු. 1 200 බැගින් මිලට ගත් භාණ්ඩ 20 ක් ව්‍යාපාරය සතු විය. තොග නිකුත් කිරීමේ දී පෙර ඇතුළු පෙර පිට (FIFO) ක්‍රමය භාවිතා කරයි. 2019 දෙසැම්බර් මාසය සඳහා විකුණුම් පිරිවැය කොපමණ ද?

1. රු. 106 000
2. රු. 110 000
3. රු. 120 000
4. රු. 130 000
5. රු. 135 000 (……….)

28. 2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමකට අදාලව පහත තොරතුරු දී ඇත.

| | රු.'000 |
|---|---|
| වර්ෂය සඳහා ලාභය | 1 000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ වල අඩු වීම | 160 |
| තොගයේ වැඩි වීම | 200 |
| වර්ෂයේ අවසාන ආදායම් බදු වගකීම | 100 |
| වර්ෂය සඳහා ගෙවූ ආදායම් බදු | 70 |
| ගොඩනැගිලි ක්ෂය | 170 |
| මෝටර් රථ ක්ෂය | 100 |
| මෝටර් රථ විකිණීමේ අලාභය | 40 |

LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශය) ප්‍රමිතියට අනුව 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහ සමාගමේ මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

1. රු. 1 120 000
2. රු. 1 480 000
3. රු. 1 050 000
4. රු. 1 170 000
5. රු. 1 000 000 (……….)

SPEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

29. සමාගමක් තම අයභාර සංචිත ප්‍රයෝජනයට ගෙන සංචිත ප්‍රාග්ධනිත කිරීමක් කල විට කොටස් හිමියන්ගේ හිමිකමට හා සමාගමේ මුදල්ශේෂය වන බලපෑම වනුයේ,

| | හිමිකම | මුදල් ශේෂය |
|---|---|---|
| 1. | වැඩි වේ. | වැඩි වේ. |
| 2. | අඩු වේ. | අඩු වේ. |
| 3. | වෙනස් නොවේ. | වැඩි වේ. |
| 4. | වෙනස් නොවේ. | වෙනස් නොවේ. |
| 5. | වැඩි වේ. | වෙනස් නෙවේ. |

(..........)

30. සී/ස රමණි සමාගමේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයෙන් උපුටාගත් තොරතුරු පහත වේ.

| | 2020/03/31 ට රු.'000 | 2021/03/31 දිනට රු.'000 |
|---|---|---|
| පොදු සංචිත | 170 | 250 |
| ප්‍රත්‍යාගණන සංචිත | 75 | 175 |
| රඳවාගත් ලාභ | 350 | 550 |

2020/2021 වර්ෂ සඳහා ගෙවූ ලාභාංශ රු. 100 000 කි.

දී ඇති තොරතුරු අනුව 2021/03/31 න් අවසන් කාලච්ඡේදය සඳහා ලාභය වනුයේ,

1. රු. 200 000
2. රු. 480 000
3. රු. 730 000
4. රු. 830 000
5. රු. 380 000

(..........)

- නිශ්චිත පිලිතුරු සපයන්න.

31. නව ගිණුම්කරණ ප්‍රමිතයක් හඳුන්වා දීම අයත් වන්නේ ගිණුම්කරණයට බලපාන කුමණ පරිසර සාධකයටද?

.....................................................................................................................................

32. සමාගමක අධ්‍යක්ෂවරයකුට දුන් කුඩා ණය මුදලක් වුවද එය වෙනම අනාවරණය කිරීමට පදනම් වන ගිණුම්කරණ සංකල්පය කුමක් ද?

.....................................................................................................................................

33. මූල්‍ය ගිණුම්කරණය සම්බන්ධව සත්‍ය අසත්‍ය දක්වන්න.

| | | සත්‍ය/ අසත්‍ය |
|---|---|---|
| A - | ගිණුම්කරණ ප්‍රමිත අදාළ වේ. | ................................ |
| B - | පුරෝකථන තොරතුරු පදනම් කර ගනියි. | ................................ |
| C - | බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන්ය තොරතුරු සපයයි. | ................................ |
| D - | ගිණුම්කරණ කාලච්ඡේදයක් සඳහා තොරතුරු ඉදිරිපත් කරයි. | ................................ |

34. ලිපිද්‍රව්‍ය අලෙවිසැලක පහත ගණුදෙනු සටහන් කරන මූලික පොත් සඳහන් කරන්න.

| | | මූලික පොත් |
|---|---|---|
| A - | ලිපිද්‍රව්‍ය ණයට මිලදී ගැනීම. | ................................ |
| B - | ණයට ගත් ලිපිද්‍රව්‍ය වලින් කොටසක් දෝශ සහිත නිසා ආපසු යැවීම. | ................................ |
| C - | මෝටර් රථයක් ණයට ගැනීම. | ................................ |
| D - | ලිපි ද්‍රව්‍ය තොගයක් අත්පිට විකිණීම. | ................................ |

SPEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

35. පහත මූලික පොත්වලට අදාළ මූලාශ්‍ර ලියවිලි නම් කරන්න.

| | | |
|---|---|---|
| A - | ආපසු එවුම් ජ'නලය | ………………………….. |
| B - | පොදු ජ'නලය | ………………………….. |
| C - | මුදල් ලැබීම් ජ'නලය | ………………………….. |
| D - | සුළු මුදල් ගෙවීම් ජ'නලය | ………………………….. |

36. ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන මූල්‍ය වාර්ථාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ මූලිකාංග හඳුනා ගැනීම සඳහා ඉටුවිය යුතු නිර්නායක මොනවාද?

I. ……………………………………………………………………………………………

II. ……………………………………………………………………………………………

37. 'සෙවන' සමාගම උප නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රණයක් ජපානයෙන් මිලට ගත් අතර ඊට අදාළ වියදම් පහත පරිදි විය.

| | |
|---|---|
| යන්ත්‍රයේ ගැනුම් මිල | රු. 500 000 |
| තීරු බදු | රු. 50 000 |
| ප්‍රවාහන වියදම් - නැව් සඳහා | රු. 46 000 |
| ලොරි සඳහා | රු. 26 000 |
| සවිකිරීමේ වියදම් | රු. 15 000 |
| නඩත්තු වියදම් දිනකට | රු. 5 000 |

මෙම යන්ත්‍රය නිසි ලෙස සවි නොකිරීම හේතුවෙන් නැවත සවි කිරීම සඳහා 7 000 ක් වැය වන ලදි. මෙම යන්ත්‍රයේ පිරිවැය වනුයේ,

රු. ……………………………………………………………………………………………...

38. 2021/03/31 ට සමාගමක ජංගම අනුපාතය 3:1 ක් විය. මෙදිනට සමාගම සතුව රු. 50 000 ක තොග පැවති අතර ජංගම වගකීම් වල වටිනාකම රු. 150 000 ක් විය.

(අ) 2021/03/31 දිනට ජංගම වත්කම් වල වටිනාකම කොපමණද? ………………………………

(ආ) 2021/03/31 දිනට ක්ෂණික අනුපාතය කොපමණ ද? ………………………………………..

39. XY සමාගම 2018/03/31 දින මිලට ගත් යන්ත්‍රයක පිරිවැය රු. 800 000 ක් වන අතර එහි සුනුබුන් අගය රු. 250 000 කි. ඵලදායීජීව කාලය වසර 5 කි. 10% බැගින් හීනවන ශේෂ ක්‍රමයට ක්ෂය කරන ලදි. නමුත් 2019/04/01 දින සිට මෙය සරල මාර්ග ක්‍රමයට ඉතිරි ඵලදායී ජීවකාලය මත ක්ෂය කිරීමට තීරණය කර ඇත. 2020/03/31 න් අවසන් වර්ෂය සඳහා ක්ෂය කොපමණද?

……………………………………………………………………………………………………

40. සමාගමක කෙටි කාලීන ණය වගකීම් හා දිගු කාලීන ණය වගකීම් මැනීම සඳහා භාවිතා කල හැකි අනුපාතය බැගින් ලියන්න.

(අ) කෙටි කලීන ණය වගකීම …………………………………………………………...

(ආ) දිගු කාලීන ණය වගකීම ……………………………………………………………

41. අමල් කමල් හා නිමල් විසින් පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරයේ 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ කොටස් පහත පරිදි බෙදා දී ඇත.

- අමල් 300 000, කමල් 180 000, නිමල් 120 000 නමුත් ව්‍යාපාරයේ ලාභය ගණනය කිරීමේදී රු. 100 000 ක වියදමක් නොසලකා හැර ඇත. ප්‍රාග්ධන පොළී පහත පරිදි වේ.
- අමල් 100 000, කමල් 60 000, නිමල් 40 000 හවුල්කරුවන්ට හවුල් වේතන සඳහා හිමිකමක් නොමැති නම් කමල්ට හිමිවන ලාභ කොටස කොපමණද?

රු. ……………………………………………………………………………………………...

SPEEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

42. LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමිතිය අනුව පහත ප්‍රකාශවල සත්‍ය අසත්‍ය බව දක්වන්න.

A - පොදු තොරතුරු අවශ්‍යතා වෙනුවෙන් පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන LKAS 01 ට අනුව පිළියෙල කල යුතුය. (……………….)

B - ප්‍රමිතියක් මගින් නිර්දේශ කිරීමේදී ඉඩදීමකදී හැර වත්කම් හා වගකීම් හිලව් කල නොහැක. (……………......)

C - ආදායම් ප්‍රකාශය තුල වියදම් වර්ගීකරණය ස්වාභාවය හෝ අදාළතාවය මත වර්ග කල හැකිය. (……………......)

D - සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳෙන්නේ සමාගමේ ගණකාධිකාරීවරයාය. (……………......)

43. අදාල තීරුවෙහි "✓" ලකුණක් යොදමින් සත්‍ය හෝ අසත්‍ය බව දක්වන්න.

| | | සත්‍ය | අසත්‍ය |
|---|---|---|---|
| (අ) | වර්ෂයක් තුල ලාභයක් ඉපයූ විට වසර අග මුදල් ශේෂය හැමවිටම වැඩි වේ. | ........................ | ........................ |
| (ආ) | ණයමත ගෙවූ පොලී නිසා හිමිකම අඩු වේ. | ........................ | ........................ |
| (ඉ) | ආයතනයක තොරතුරු භාවිතා කරන බාහිර පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා විශේෂිත පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන සකසනු ලැබේ. | ........................ | ........................ |
| (ඊ) | 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වනන වගන්තියට අනුව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂ මත 5% ක පොලියක් ගෙවිය යුතුවේ. | ........................ | ........................ |

44. ගිණුම්කරණය සම්බන්ධව පහත තීරණ නිසා කඩවන ගිණුකරණ සංකල්පය ලියන්න.

A - දේපල පිරියත උපකරණ ප්‍රත්‍යාගණන අගයට හඳුනා ගැනීම. …………………………..

B - ව්‍යාපාරයක සියළු වත්කම් ජංගම වතකම් ලෙස හඳුනා ගැනීම. …………………………..

C - සාමාජික මුදල් ආදායම මුදල් පදනමට හඳුනා ගැනීම. …………………………..

D - තොග වත්කම ශුද්ධ උපලබ්ධි අගයට දැක්වීම. …………………………..

45. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට අනුව වත්කමක ලක්ෂණ ලියා දක්වන්න.

I. ……………………………………………………………………………………………

II. ……………………………………………………………………………………………

III. ……………………………………………………………………………………………

46. දේපල පිරියත උපකරණ සම්බන්ධව පොදු ජ'නලයේ තබන සටහන් 04 ක් ලියා දක්වන්න.

I. ……………………………………………………………………………………………

II. ……………………………………………………………………………………………

III. ……………………………………………………………………………………………

IV. ……………………………………………………………………………………………

SPEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

47. පහත තොරතුරු 2020/03/31 න් අවසන් මාසය සඳහා සමාගමකට අදාල වේ.

| **විස්තරය** | **ඒකක** | **ඒකක මිල** |
|---|---|---|
| 2020.03.01 ට තොගය | 1 000 | 90 |
| 2020.03.13 මිලට ගැනීම් | 5 000 | 100 |
| 2020.03.15 මිලට ගැනීම් | 3 000 | 120 |
| 2020.03.20 විකුණුම් | 7 000 | - |

තොග නිකුත් කිරීම සඳහා බරිත සමාන්‍ය මිල ක්‍රමය යොදා ගනියි. 2020/03/31 දිනෙන් අවසන් මාසය සඳහා විකුණුම් පිරිවැය හා 2020/03/31 දිනට අවසන් තොගයේ වටිනාකම කොපමණද?

I. විකුණුම් පිරිවැය ………………………………………………………………………

II. අවසන් තොගය ………………………………………………………………………

48. සී/ස චමින්ද පොදු සමාගමේ 2019.03.31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂවරු විසින් 2020.06.30 දින අනුමත කරන ලදි. 2020.03.31 දින සිට 2020.06.30 දක්වා කාලයේ දී පහත සිද්ධීන් සමාගමෙන් සිදු විය.

(අ) 2020/05/01 දින සිට සමාගමේ ආයෝජනයක වෙළඳපොළ වටිනාකම අඛණ්ඩව පහත වැටීම.

(ආ) 2020/04/30 දින ඇති වූ ගින්නකින් 2020/03/31 ට පැවති තොගය විනාශ වීම.

(ඉ) උසාවි තීන්දුවකට අනුව ශේෂපත්‍ර දිනයට හඳුනගත යුතු වගකීමෙන් තිබූ බව තහවුරු වීම.

ඉහත සිද්ධීන් අතරින් ශේෂපත්‍ර දිනයට ගැලපිය යුතු සිද්ධීන් මොනවාද?

………………………………………………………………………………………………..

………………………………………………………………………………………………..

49. නිෂ්පාදන ව්‍යාපාරයක 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ලබා දී ඇත.

| | රු.'000 |
|---|---|
| 2019/04/01 ට අමුද්‍රව්‍ය | 80 000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | 420 000 |
| පරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැය | 410 000 |
| අනෙකුත් සෘජු වියදම් | 170 000 |
| නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය | 140 000 |
| නොනිමි තොගවල වැඩිවීම | 20 000 |

I. 2020/03/31 ට අමුද්‍රව්‍ය තොගයේ වටිනාකම කොපමණද? …………………………

II. 2020/03/31 න් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය කොපමණද? …………………………

50. හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරන අවස්ථා දෙකක් ලියන්න.

I. ………………………………………………………………………………………

II. ………………………………………………………………………………………

*****



SPEDEXAM2021
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

තෙවන වාර පරීක්ෂණය 2021
Third Term Test

13 ශ්‍රේණිය
Grade 13

ගිණුම්කරණය -II

පැය 3

# II කොටස

**උපදෙස් :**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 ක් සඳහා පිළිතුරු සපයන්න.**

01. සී/ස තරුලංකා සමාගමේ 2021/03/31 න් අවසන් ගිණුම් වර්ෂයේ ශේෂ පිරික්සුම පහත පරිදි විය.

| විස්තරය | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| විකුණුම් | | 8 300 |
| විකුණුම් පිරිවැය | 2 800 | |
| දේපළ පිරියත හා උපකරණ (ධාරණ අගය) | 39 500 | |
| මෝටර් රථ | 1 500 | |
| 10% බැංකු ණය | | 4 000 |
| 12% ආයෝජන | 1 000 | |
| ආයෝජන ආදායම් | | 60 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ/ වෙළෙඳ ගෙවිය යුතු දෑ | 840 | 2 700 |
| 2020/04/01 ට හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම් | | 58 |
| කල්බදු පොළී | 1 500 | |
| විගණන ගාස්තු | 100 | |
| 2021/03/31 ට තොගය (පිරිවැයට) | 900 | |
| විකුණුම් අත්තිකාරම් | | 100 |
| වගකීම් සහතික වියදම් | 200 | |
| 2020/04/01 ට වගකීම් සහතික වෙන් කිරීම් | | 270 |
| ආදායම් බදු 2019/2020 | 250 | |
| 2020/2021 | 370 | |
| 2020/04/01 ට ආදායම් බදු වෙන් කිරීම් | | 260 |
| පරිපාලන වියදම් | 1 060 | |
| බෙදාහැරීමේ වියදම් | 940 | |
| ප්‍රචාරණ | 60 | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | | 30 000 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 1 000 |
| පොදු සංචිත | | 200 |
| රඳවාගත් ලාභ | | 2 002 |
| මුදල් හා මුදල් සමාන දෑ | 440 | |
| කොමිස් ආදායම් | | 1 550 |
| ලද ගෙවල් කුලී | | 1 000 |
| ගෙවූ ලාභාංශ | 40 | |
| | 51 500 | 51 500 |

අතිරේක තොරතුරු :-

✶ 2020/04/01 දිනට ව්‍යාපාරයේ දේපළ පිරියත උපකරණ සම්බන්ධව තොරතුරු පහත වේ.

| වත්කම | පිරිවැය/ප්‍රත්‍යාගණන අගය(රු.'000) | 2020/04/01 ට සමුච්චිත ක්ෂය (රු.'000) | වාර්ෂික ක්ෂය අනුපාතය |
|---|---|---|---|
| ඉඩම් | 18 000 | - | - |
| ගොඩනැගිලි | 12 000 | 1 800 | 20% |
| යන්ත්‍ර | 8 000 | 1 200 | 10% |
| ලී බඩු | 6 000 | 1 500 | 5% |
| | 44 000 | 4 500 | |

8 ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන් කර නැත.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

I. 2020/04/01 දින ඉඩම් රු. 20 000 000 ට ද ගොඩනැගිලි ප්‍රථම වරට රු. 11 500 000 ට ද ප්‍රත්‍යාගණනය කර ඇත. ඉඩම් මෙයට පෙර ප්‍රත්‍යාගණනය කර රු. 800 000 ක ප්‍රත්‍යාගණන අලාභයක් හඳුනාගෙන තිබුණි.

II. 2020/10/01 දින පිරිවැය රු. 700 000 ක් වූ යන්ත්‍රයක් හුවමාරු කර එදිනම පිරිවැය රු. 1 000 000 ක් වූ යන්ත්‍රයක් මිලට ගෙන ඇත. ඉතිරිය මුදලින් ගෙවා ඇතත් පොත්වල සටහන් කර නැත. හුවමාරු කල යන්ත්‍රය මිලට ගෙන තිබුණේ 2018/04/01 දින වන අතර යන්ත්‍රයේ හුවමාරු අගය රු. 550 000 ක් විය.

III. 2020/04/01 දිනට හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම් ලෙස වෙන්කර තිබූ රු. 40 000 ක ණයගැතියෙකු බුන්වත් වී ඇති බව අනාවරණය වී ඇත. ඉතිරි වෙළඳ ලැබිය යුතු ශේෂය මත 5% ක් හානිකරණ අලාභ සඳහා ඉඩහැරීම් කල යුතුය.

IV. 2020/04/01 දින සමාගම කල්බදු ගිවිසුමක් යටතේ මෝටර් රථයක් ලබාගෙන ඇත. එදිනම රු. 1 000 000 ක මූලික තැන්පතුවක් ද රු. 200 000 ක ගෙන ඒමේ වියදම් ද, රු. 300 000 ක මුල්වරට ලියාපදිංචි ගාස්තු ද ගෙවා ඇත. මෙම ගෙවූ මුදල් මෝටර් රථ ගිණුමේ සටහන් කර ඇත. කල්බදු කාලය වසර 4 ක් වන අතර ඵලදායී ජීව කාලය වසර 5 කි. කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය සමාගමට හිමි නොවේ. වාර්ෂික කල්බදු පොළිය 10% ක් වන අතර කල්බදු වාරිකය රු. 1 500 000 කි. පළමු වසර වාරිකය ගෙවා එය කල්බදු පොළී ගිවිසුමට හර කර ඇත. 10% වට්ටම් සාධකය පහත වේ.

| වර්ෂය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|
| වට්ටම් සාධකය | 0.9 | 0.8 | 0.7 | 0.6 |

V. 2021/03/31 න් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021/07/31 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. 2021/03/31 දිනට පැවති තොගය 2021/04/10 දින රු. 850 000 ට විකුණා ඇති අතර විකිණීමේ දී රු. 10 000 ක වියදම් වියදම් දරා ඇත.

VI. 2020/03/31 දින ව්‍යාපාරය රු. 700 000 ප්‍රතිෂ්ඨාවකට භාණ්ඩ විකිණීම සඳහා ගණුදෙනුකරුවෙකු සමඟ ගිවිසුමක් ඇති කරගෙන තිබූ අතර එදින රු. 100 000 ක විකුණුම් අත්තිකාරමක් ලබාගෙන ඇත. ව්‍යාපාරය 2020/05/01 දින ප්‍රතිෂ්ඨාවට අදාල සම්පූර්ණ භාණ්ඩ ගණුදෙනුකරුට ලබාදුන් අතර ගණුදෙනුකරු මුදල් පියවා ඇත. සමාගම ලද අත්තිකාරම් පමණක් සටහන් කර ඇත.

VII. ව්‍යාපාරය වාර්ෂික විකුණුම් ආදායම මත 2% ක් වගකීම් සහතික වෙන් කිරීමක් කරයි. වගකීම් සහතික වියදම් ගෙවා තිබුණේ 2020/03/31 න් අවසන් වර්ෂය වෙනුවෙනි.

VIII. 2020/01/01 දින සේවකයෙකු රු. 100 000 ක වන්දියක් ඉල්ලා නඩුවක් පවරා ඇති අතර සමාගමේ නීතිඥයින්ගේ මතය වූයේ මෙම වන්දි මුදල ගෙවීමට සිදුවිය හැකි බවයි.

IX. ප්‍රවර්තන වර්ෂයේ ආදායම් බදු වියදම රු. 570 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2019/2020 වර්ෂයේ ආදායම් බදු සම්පූර්ණයෙන් ගෙවා ඇත.

X. 2021/03/31 දින අධ්‍යක්ෂ මණ්ඩලය පහත යෝජනා කර ඇත.
a - සාමාන්‍ය කොටස් සඳහා රු.1.50 ක ලාභාංශයක් ගෙවීමට
b - රු. 250 000 ක් රඳවාගත් ඉපයුම් භාවිතාකර පොදු සංචිතයක් ඇති කිරීමට

XI. 2021/03/31 දින බැංකු ණය ලබාගෙන ඇති අතර ඊලඟ ගිණුම් වර්ෂයේ සිට සමාන වාරික 4 කින් එම බැංකු ණය ගෙවා අවසන් කල යුතුය.

XII. උපචිත විගනන ගාස්තු රු. 20 000 කි. ඉදිරියට ගෙවූ ප්‍රචාරණ රු. 40 000 කි.

අවශ්‍ය වන්නේ ,

1. 2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2. 2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය
3. 2021/03/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
4. ගිණුම් වලට අවශ්‍ය සටහන් **(ලකුණු 20)**

SPEEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

02. සී/ස බුද්ධිම පොදු සමාගම එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සමාගමකි. භාණ්ඩ මිලට ගැනීම හා විකිණීම ණය පදනම මෙන්ම මුදල් පදනම ද සිදු කරයි. 2020/02/28 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | | (රුපියල්) |
|---|---|---|
| මුදල් පාලන ගිණුම | | 510 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ - | කුසල් | 300 000 |
| | නිසල් | 200 000 |
| | කමල් | 100 000 |
| ගෙවිය යුතු VAT | | 90 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ - | ගජිත් | 150 000 |
| | රංජිත් | 210 000 |
| | සුරංජිත් | 175 000 |

2020 මාර්තු මාසය තුල පහත ගණුදෙනු සිදු වී ඇත. VAT අනුපාතය 8% කි

I. VAT සහිත ණයට ගැනුම් පහත පරිදි විය. (රුපියල්)

| | | |
|---|---|---|
| ගජිත් | - | 432 000 |
| රංජිත් | - | 324 000 |
| සුරංජිත් | - | 594 000 |

II. VAT රහිත විකුණුම් පහත පරිදි විය. (රුපියල්)

| | | |
|---|---|---|
| කුසල් | - | 450 000 |
| නිසල් | - | 600 000 |
| කමල් | - | 700 000 |

III. මාර්තු මාසයට අදාළ මුදල් ලැබීම් පහත පරිදි විය.

- VAT සහිත අත්පිට විකුණුම් රු. 972 000
- ණයගැති ලැබීම් හා දුන් වට්ටම් පහත වේ. (රුපියල්)

| | මුදල් | දුන් වට්ටම් |
|---|---|---|
| කුසල් | 525 000 | 5 000 |
| නිසල් | 497 000 | 3 000 |
| කමල් | 198 000 | 2 000 |

- ගෙවල් කුලී ආදායම් ලැබුණා රු. 25 000

IV. මාර්තු මාසයට අදාළ මුදල් ගෙවීම් පහත පරිදි විය.

- VAT සහිත අත්පිට ගැනුම් රු. 540 000
- ණයහිමි ගෙවීම් හා ලද වට්ටම් පහත වේ. (රුපියල්)

| | මුදල් | ලද වට්ටම් |
|---|---|---|
| ගජිත් | 159 000 | 1 000 |
| රංජිත් | 173 000 | 2 000 |
| සුරංජිත් | 218 000 | 2 000 |

V. මාර්තු මාසය සඳහා ව්‍යාපාරයේ වියදම් ලෙස රු. 15 000 ක් ගෙවා තිබුණි.

VI. ගෙවූ VAT රු. 20 000 ක් විය.

අවශ්‍ය වන්නේ,

1. 2020/03/31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත්
   - ගැනුම් ජ'නලය
   - විකුණුම් ජ'නලය
   - මුදල් ලැබීම් ජ'නලය
   - මුදල් ගෙවීම් ජ'නලය

2. 2020/03/31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ලෙජර් ගිණුම්
   - මුදල් පාලන ගිණුම
   - වෙළෙඳ ලැබිය යුතු දෑ
   - වෙළෙඳ ගෙවිය යුතු දෑ
   - VAT පාලන ගිණුම

**(ලකුණු 20)**

SPEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

03. 2019/04/01 දින සචිත් ලක්ෂිත තම පුද්ගලික මුදල් රු. 1 000 000 ක් ආයෝජනය කර ක්‍රීඩා උපකරණ විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. එදිනම 12% ක වාර්ෂික පොළියකට රු. 500 000 ක බැංකු ණයක් ලබා ගෙන ඇත. අප්‍රේල් මාසය තුල පහත ගණුදෙනු සිදු වී ඇත.

I. 2019/04/01 රු. 200 000 ක් වටිනා ගොඩනැගිලි ද, රු. 100 000 ක් වටිනා මෝටර් රථ ද , රු. 50 000 ක් වටිනා උපකරණ ද මිලට ගන්නා ලදි. වාර්ෂිකව ගොඩනැගිලි 24% ක් ද, මෝටර් රථ හා උපකරණ 12% ක් ද ක්ෂය කරයි.

II. මාසය තුල රු. 600 000 ක තොග මිලට ගෙන ඇති අතර ඉන් රු. 150 000 ක තොග ණයට ගෙන තිබුණි.

III. අප්‍රේල් මාසය තුල මුළු විකුණුම් රු. 1 050 000 ක් වූ අතර ඉන් රු. 650 000 ක් මුදලට විකුණුම්ය. මෙම තොග වල පිරිවැය රු. 500 000 කි.

IV. පිරිවැය රු. 10 000 ක් වූ තොග ආපසු එවා ඇත. ඒවායේ විකුණුම් මිල රු. 15 000 කි.

V. මාසය සඳහා කුලී ආදායම් රු. 60 000 ක් මුදලින් ලැබී ඇත.

VI. සංජය මාසය තුල රු. 5 000 ක් මුදල් හා රු. 3 000 ක් භාණ්ඩ පුද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇත.

VII. රු. 25 000 ක බැංකු ණයක් ගෙවීම සඳහා මාසය තුල රු. 30 000 ක් ගෙවා ඇත.

VIII. මාසය තුල රු. 85 000 ක ණයගැතිභාවය වෙනුවෙන් රු. 80 000 ක් ලැබී ඇත.

IX. වෙළෙඳහිමියන්ට රු. 40 000 ක් ගෙවා ඇති අතර ලද වට්ටම රු. 10 000 කි.

X. මාසයට අදාල මෙහෙයුම් වියදම් රු. 25 000 ක් ගෙවා ඇත.

අතිරේක තොරතුරු :-

1. අප්‍රේල් මාසයට අදාළ රු. 4 000 ක දුරකතන හා රු. 8 000 ක විදුලි බිල් ලැබී ඇත.

2. අප්‍රේල් මස ව්‍යාපාරයේ සංග්‍රහ වියදම් රු. 20 000 ක් සචිත් තම පෞද්ගලික මුදලින් දරා ඇත.

3. ණයගැතියකුගෙන් රු. 10 000 ක චෙක්පතක් ලැබී තිබූ අතර ඒ පිළිබඳව දැනගත්තේ අප්‍රේල් මස බැංකු ප්‍රකාශය ලද පසුවයි.

අවශ්‍ය වන්නේ,

1. අංක 01 සිට 10 දක්වා ගණුදෙනු වල බලපෑම පහත සමීකරණය යටතේ (+) හා (-) ලෙස දක්වන්න.

| අංකය | වත්කම් = | | | | වගකීම් + | | හිමිකම් |
|---|---|---|---|---|---|---|---|
| | දේ.පි.උ. | තොගය | ණයගැතියෝ | මුදල් | බැංකු ණය | ණයහිමියෝ | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

2. 2019 අප්‍රේල් මාසය සඳහා ආදායම් ප්‍රකාශය
3. 2019/04/30 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය **(ලකුණු 20)**

SPEDEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

04. (අ) සී/ස රිෂිනි පොදු සමාගමේ මුදල් ගණුදෙනු බැංකු ගිණුමක් ආශ්‍රයෙන් සිදු කරනු ලබන අතර 2020 මාර්තු මාසය සඳහා පහත තොරතුරු සපයා ඇත.

- සමාගමේ ගිණුම් පොත් වලට අනුව මාර්තු මස මුදල් ගණුදෙනුවල සාරාංශය

| | රු.'000 |
|---|---|
| 2020/03/01 ශේෂය | 520 |
| 2020 මාර්තු මස මුදල් ලැබීම් ජ'නලයේ එකතුව | 3500 (ණයගැති ලැබීම්) |
| 2020 මාර්තු මස මුදල් ගෙවීම් ජ'නලයේ එකතුව | 2700 (ණයහිමි හා වියදම් ගෙවීම්) |

- 2020 මාර්තු මාසය සඳහා ලද බැංකු ප්‍රකාශයේ සාරාංශය

| | රු.'000 |
|---|---|
| 2020/03/01 ශේෂය | 640 |
| උපලබ්ධි වූ චෙක්පත් | 1250 |
| මුදල් තැන්පතු | 500 |
| ගෙවන ලද චෙක්පත් | 1950 |
| ණයගැති සෘජු ප්‍රේෂණ | 200 |
| ස්ථාවර නියෝග ගෙවීම් | 80 |
| 2020/03/31 දිනට ශේෂය | 560 |

- 2020/03/01 දින ශේෂ අතර වෙනසට හේතු වූයේ ඉදිරිපත් නොවූ චෙක්පතකි. එය මාර්තු මාසය තුළ බැංකුවට ඉදිරිපත් වී ඇත.
- 2020 මාර්තු මස ගෙවල්කුලී සඳහා නිකුත් කලල රු. 40 000 ක චෙක්පතක් අගරු කර ඇත. එම අගරු වීම ව්‍යාපාරයේ පොත්වල ලියා නැත.
- 2020 මාර්තු මස බැංකු ප්‍රකාශය ලැබෙනතුරු ණයගැති ප්‍රේෂණ හා ස්ථාවර නියෝග ගෙවීම් මුදල් පාලන ගිණුමේ ලියා නැත.

අවශ්‍ය වන්නේ,

1. 2020 මාර්තු මාසය සඳහා බැංකු ප්‍රකාශය ලැබීමට පෙර මුදල් පාලන ගිණුම
2. සංශෝධිත මුදල් පාලන ගිණුම
3. 2020/03/31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය **(ලකුණු 10)**

(ආ) සරුණි හා ලිහිණි සම සමව ලාභ බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගිය අතර 2019/04/01 දින ලාභයෙන් 1/3 ක් සඳහා හිරුණි හවුල්කරුවෙකු ලෙස ව්‍යාපාරයට එක් විය. එදින හිරුණි ප්‍රාග්ධනය හා කීර්තිනාමය ලෙස රු. 1 450 000 ක් ගෙන ආ අතර එය හිරුණි රැගෙන ආ මුදල් ගිණුමට බැර කර ඇත. 2019/04/01 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 900 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. පහත කොන්දේසි සඳහා හවුල්කරුවන් එකඟ වී ඇත.

I. කීර්ති නාමය ගැලපූ පසු ප්‍රාග්ධන ශේෂ මත 10% ක ප්‍රාග්ධන පොලියක් ගෙවීම.
II. සෑම හවුල්කරුවෙකුම රු. 5000/= බැගින් මාසික වේතන හිමිවේ.
III. හවුල්කරුවන් සපයා ඇති ණය සඳහා 8% ක වාර්ෂික පොලියක් හිමිවේ.

2020/03/31 දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

රු.'000

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ගැණුම් / විකුණුම් | 806 | 1 508 |
| ආපසු එවුම් / ආපසු යැවුම් | 3 | 4 |
| දුන් වට්ටම් / ලද වට්ටම් | 8 | 4 |
| වරිපනම් | 2 | 2 |
| විදුලිය | 10 | |
| ප්‍රචාරණ | 90 | |
| 2019/04/01 තොගය | 12 | |
| විකුණුම් කොමිස් | | 10 |
| ප්‍රාග්ධන ගිණුම් සරුණි | | 1000 |
| ලිහිණි | | 1000 |
| ජංගම ගිණුම් සරුණි | | 160 |
| ලිහිණි | 20 | |
| හිරුණි රැගෙන ආ මුදල | | 1450 |

SPEEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

| | | |
|---|---|---|
| සරුණිගේ ණය (2019/10/01 ගත්) | | 100 |
| 10% බැංකු ණය (2020/01/01 ගත්) | | 200 |
| ගැනිලි සරුණි | 10 | |
| ලිහිණි | 15 | |
| හිරුණි | 18 | |
| බැංකු ණය පොළී | 11 | |

I. 2020/03/31 දිනට තොගයේ පිරිවැය රු.400 000 කි. ඒවායේ ශුද්ධ උපලබ්ධි අගය රු. 380 000 කි.

II. 2019/12/01 දින ලිහිණි හදිසි අනතුරකට ලක් වූ අතර ප්‍රතිකාර ලබාගත් රෝහලේ ගාස්තුව රු. 35 000 ක් ව්‍යාපාරයේ මුදලින් ගෙවා ඇත.

III. සරුණි හා හිරුණි මාස 06 ක හවුල් වේතන මුදලින් ලබා ගෙන ඇතත් එය පොත්වල සටහන් කර නැත.

IV. පොළී වියදම් ලෙස සටහන් වන්නේ බැංකු ණය පොළී හා සරුණිගෙන් ණයට ගෙවූ පොළී යන දෙකම වේ.

V. ලිහිණිගේ ව්‍යාපාරයේ ගමන් වියදම් රු. 50 000 ක් තම පුද්ගලික මුදලින් ගෙවා ඇතත් ඒ පිළිබඳව සටහනක් ලබා නොමැත.

අවශ්‍ය වන්නේ,

1. 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
2. 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජංගම ගිණුම්
3. 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාග්ධන ගිණුම් **(ලකුණු 10**

05. (අ) "හසිත් කොන්ක්‍රීට් වර්ක්ස්" සිමෙන්ති ගඩොල් නිෂ්පාදන ව්‍යාපාරයකි. 2020/03/31 දිනට ව්‍යාපාරය සකස් කල ශේෂ පිරික්සුමෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | (රුපියල්) |
|---|---|
| 2019/04/01 ට තොග - | |
| අමුද්‍රව්‍ය | 6 000 |
| නොනිමි | 60 000 |
| නිමි | 80 000 |
| සෘජු අමුද්‍රව්‍ය ගැනුම් | 140 000 |
| වක්‍ර අමුද්‍රව්‍ය ගැනුම් | 120 000 |
| විදුලිය | 3 000 |
| ජලය | 4 000 |
| ප්‍රචාරණ | 10 000 |
| පුරස්කාර | 200 000 |
| බොල් ණය | 5 000 |
| වට්ටම් | 1 000 |
| යන්ත්‍ර (පිරිවැයට) | 300 000 |
| ගොඩනැගිලි (පිරිවැයට) | 600 000 |
| වැටුප් හා වේතන | 1 700 000 |
| අනෙකුත් පොදු කාර්යය වියදම් | 30 300 |
| ඉන්ධන | 3 000 |

අතිරේක තොරතුරු :-

I. 2020/03/31 දිනට පැවති තොග පිළිබඳ තොරතුරු පහත වේ.

| | (රුපියල්) |
|---|---|
| සෘජු අමුද්‍රව්‍ය | 10 000 |
| වක්‍ර අමුද්‍රව්‍ය | 10 000 |
| නොනිමි | 39 000 |
| නිමි | 12 000 |

II. 2020/03/31 දිනට පැවති වක්‍ර අමුද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම හානි වී ඇති අතර ඒවායේ ශුද්ධ උපලබ්ධි අගය ශුන්‍ය වේ.



SPEDEXAM2021
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

III. ව්‍යාපාරයේ වියදම් පහත පරිදි නිෂ්පාදන අංශ හා විකුණුම් අංශ වෙත බෙදාහල යුතුය.

| | නිෂ්පාදන අංශය | විකුණුම් අංශය |
|---|---|---|
| විදුලිය | 80% | 20% |
| ජලය | 60% | 40% |
| වරිපනම් | 40% | 60% |
| ගොඩනැගිලි ක්ෂය | 2/3 | 1/3 |
| යන්ත්‍ර ක්ෂය | 100% | - |

IV. යන්ත්‍ර වාර්ෂිකව 10% ක් ද ගොඩනැගිලි වාර්ෂිකව 5% ක් ද ක්ෂය කරයි.

V. ව්‍යාපාරයේ වැටුප් හා වේතන පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සෘජු වැටුප් | රු. | 800 000 |
| වක්‍ර වැටුප් | රු. | 700 000 |
| පරිපාලන සේවක | රු. | 200 000 |
| | රු. | 1 700 000 |

VI. නිෂ්පාදන ඒකකයක් සඳහා රු. 20/= පුරස්කාරකයක් ගෙවිය යුතුය. වර්ෂය තුල නිපද වූ සියලු නිෂ්පාදන ඒකක වලට අදාළව පුරස්කාර නිසි පරිදි මුදලින් ගෙවා ඇත.

VII. 2020/01/01 දින ව්‍යාපාරය නිෂ්පාදන අංශය සඳහා රු. 300 000 ක් පිරිවැය පරිගණකයක් මිලට ගෙන ඇත. පරිගණක වාර්ෂිකව 10% ක් ක්ෂය කරයි.

VIII. ව්‍යාපාරය පිරිවැය මත 25% ක ලාභ තබාගෙන විකුණුම් මිල තීරණය කරයි.

**<u>අවශ්‍ය වන්නේ,</u>**

1. 2020/03/31 න් අවසන් වසර සඳහා නිෂ්පාදන ලේඛනය
2. ගඩොලක නිෂ්පාදන පිරිවැය
3. ගඩොලක විකුණුම් මිල **(ලකුණු 10)**

(ආ) 2020/03/31 දිනට ව්‍යාපාරයක් ගිණුම් වාර්තා පිළියෙල කර තිබූ අතර එදිනට කෙටුම්පත් ශුද්ධ ලාභය රු. 510 000 ක් විය. පසුව කරන ලද විමර්ෂණ වලදී ව්‍යාපාරයේ අවිනිශ්චිත ගිණුමක රු. 2 000 ක හර ශේෂයක් ඇති බව අනාවරණය විය. ඒ සඳහා බලපෑ ඇති හේතු පහත පරිදි සොයාගෙන ඇත.

I. රු. 15 000 ක ලද විකුණුම් අත්තිකාරකමක් වෙනුවෙන් වර්ෂය අවසාන වන විට රු. 10 000 ක භාණ්ඩ සපයා තිබුණි. නමුත් ලද මුළු අත්තිකාරම් මුදලම විකුණුම් ලෙස සටහන් කර තිබුණි.

II. රු. 5 000 ක දුන් වට්ටම් ණයගැති පාලන ගිණුමේ නිවැරදිව ලියා ලද වට්ටම් ගිණුමේ බැරට සටහන් කර තිබුණි.

III. 2019/10/01 දින රු. 40 000 ක ගොඩනැගිලි අලුත්වැඩියා වියදමක් ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි. ගොඩනැගිලි වාර්ෂිකව 10% ක් ක්ෂය කරයි.

IV. කොමිස් ආදායම් ගිණුමේ ශේෂය රු. 16 000 ක් වුවත් ශේෂ පිරික්සුමේ ලියා තිබුණේ රු. 10 000ක් ලෙසයි.

V. ආපසු යැවුම් රු. 3 500 ක් ආපසු එවුම් ලෙස සටහන් කර තිබුණි.

VI. ණයගැතියෙකුගෙන් ලද රු. 5 000 මුදල් ගිණුමේ නිවැරදිව ලියා ණයහිමි හා ණයගැති පාලන ගිණුම් දෙකටම බැර කර තිබුණි.

**<u>අවශ්‍ය වන්නේ,</u>**

1. වැරදි නිවැරදි කිරීමේ ජ'නල් සටහන්
2. අවිනිශ්චිත ගිණුම
3. ශුද්ධ ලාභය නිවැරදි කිරීමේ ලේඛනය **(ලකුණු 10)**

SPEDEXAM2021
PAST PAPERS WIKI



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**06.** (අ) ක්‍රීඩා සමිතියක සුභසාධක සංගමය වාර්ෂිකව පවත්වන ත්‍යාග බෙදා දීමේ වැඩ සටහන 2019/2020 වර්ෂයේදී පවත්වන ලදි. මේ සඳහා අරමුදල් රැස් කිරීමට වේදිකා නාට්‍යයක් පෙන්වන ලදි. 2019/04/01 දිනට සුභසාධක සංගමයේ මුදල් ශේෂය රු. 16 000 කි.

I. මෙම වැඩසටහන වෙනුවෙන් ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් රු. 500 000 ක මුදලක්ද, වේදිකා නාට්‍ය සඳහා ප්‍රදේශවාසීන්ගෙන් රු. 100 000 ක මුදලක්ද පරිත්‍යාග ලෙස ලැබුණි.

II. වේදිකා නාට්‍ය සඳහා ටිකට් 150 ක් මුද්‍රණය කර තිබූ අතර එහි වියදම රු. 6 000 කි.

III. වේදිකා නාට්‍යයේ ටිකට් පතක් රු. 2 500 බැගින් අලෙවි කල අතර ටිකට් 20 ක් ඉතිරිව තිබුණි.

IV. වේදිකා නාට්‍ය සඳහා රු. 25 000 ක මුදලක් ගෙවා තිබූ අතර විදුලි ආලෝකය හා ශබ්ද විකාශන සඳහා රු. 10 000 බැගින් ගෙවා තිබුණි. ශබ්ද විකාශන සඳහා රු. 6 000 ක් ගෙවීමට ඇත.

V. 2019/04/01 දින ක්‍රීඩා සමාජය සඳහා රු. 30 000 ක ත්‍රිරෝද රථයක් මිලට ගෙන තිබුණි. දේපල පිරියත හා උපකරණ වාර්ෂික ක්ෂය 20% කි

VI. ක්‍රීඩා සමාජයේ වියදම් පහත පරිදි විය.

| | |
|---|---|
| විදුලිය | රු. 10 000 |
| වැටුප් | රු. 40 000 |
| අනෙකුත් වියදම් | රු. 8 000 |

අවශ්‍ය වන්නේ,

1. වේදිකා නාට්‍ය ලාභය හෝ අලාභය
2. ක්‍රීඩා සමාජයේ ආදායම් ප්‍රකාශය
3. මුදල් ගිණුම

**(ලකුණු 10)**

(ආ) සහේෂ් රු. 1 000 000 ක් යොදවා 2019/01/01 දින ව්‍යාපාරයක් ආරම්භ කල අතර මෙම ව්‍යාපාරය නිසි පරිදි ගිණුම් පොත් පවත්වා ගෙන ගොස් නැත.

I. සහේෂ් පවසන ආකාරයට තොග විකුණනු ලබන්නේ විකුණුම් මිලට 20% ක ලාභයක් තබා ගෙන වේ.

II. 2019/12/31 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | - | රු. 550 000 |
| උපචිත දුරකතන | - | රු. 5 000 |
| අවසන් තොගය | - | රු. 175 000 |
| 10% බැංකු ණය | - | රු. 300 000 |
| ඉදිරියට ගෙවූ ප්‍රචාරණ | - | රු. 10 000 |
| දේපල පිරියත උපකරණ (පිරිවැයට) | - | රු. 300 000 |

III. 2019/01/01 දින 10% ක වාර්ෂික පොළියට බැකු ණය ලබා ගෙන ඇත.

IV. ව්‍යාපාරය ගැනුම් හා විකුණුම් ණය පදනම මත පමණක් සිදු කරයි.

V. මුදලින් ගෙවා ඇති ප්‍රචාරණ රු. 50 000 කි.

VI. 2019/01/01 දින දේපල පිරියත උපකරණ අත්පත් කර ගෙන තිබූ අතර වාර්ෂික ක්ෂය අනුපාතය 10% කි.

VII. ව්‍යාපාරයේ මුළු විකුණුම් රු. 1 200 000 ක් වූ අතර ණයට ගැනුම් වලින් 80% ක ප්‍රමාණයක් මෙම වර්ෂය තුලදී ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ,

1. 2019/12/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
2. 2019/12/31 න් අවසන් වර්ෂය සඳහා මුදල් පාලන ගිණුම
3. 2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**(ලකුණු 10**

SPEEXAM2021



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**07) අ)** විදුලි උපකරණ නිෂ්පාදන සමාගමක නිෂ්පාදන අංශ දෙකක් හා සේවා අංශයක් සහිතව ක්‍රියාත්මක වේ 2020 මැයි මාසයට අදාළ ඇස්තමේන්තු ගත මුළු පොදුකාර්ය පිරිවැය හා අනෙකුත් තොරතුරු පහත පරිදිවේ

01) නිෂ්පාදන අංශ 01 හා 02 හි සේවකයින් 10 බැගින් ද සේවා අංශයේ සේවකයින් දෙදෙනකු සේවය කරයි

02) නිෂ්පාදන අංශ 01 හා 2 හි යන්ත්‍ර වටිනාකම පිලිවෙලින් රු: 1400 000 ක් හා රු:800 000 කි

03) නිෂ්පාදය අංශ 01 හා 02 හි ක්‍රියාකාරි පැය ගණන පිලිවෙලින් රු.2000 ක් හා රු. 1500 කි වේ

04) භාවිතයට යොදා ගන්නා බිම් ප්‍රමාණය නිෂ්පාදන අංශ 01 හා 02 හි පිලිවෙළින් වර්ග මීටර් 1000 බැගින් වන අතර සේවා අංශයට වර්ග මීටර් 100 ක් වේ

05) ඇස්තමේන්තු පොදුකාර්ය පිරිවැය පහත වේ

| | |
|---|---|
| කුලී හා වරිපනම් | 4200 |
| වක්‍ර වැටුප් | 33 000 |
| යන්ත්‍ර රක්ෂණය | 33 000 |
| යන්ත්‍ර ක්‍රියාකාරිත්වයට යොදා ගන්නා බලය | 11200 |
| ආලෝකය සඳහා යොදාගන්නා විදුලි බලය | 4410 |
| සේවක සුභ සාධන වියදම් | 6600 |

සේවා අංශයේ පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන අංශ වලට නැවත විභාජනය කරනු ලබන්නේ සමානව වන අතර යන්ත්‍ර ක්‍රියාකාරි පැය ගනන පදනම් කර ගෙන පොදු කාර්යය පිරිවැය අන්තර් ග්‍රහනය කරනු ලබයි.

**අවශ්‍ය වන්නේ**

01) සුදුසු පදනම් භාවිතා කොට පොදු කාර්යය පිරිවැය එක් එක් අංශ වෙත ප්‍රාථමික හා ද්වීතීක විභාජනය කිරීම

02) විදුලි උපකරණයක් නිපදවීමට නිෂ්පාදන අංශ 1 හි පැය 6 ක් හා නිෂ්පාදන අංශ 2 හි පැය 5 ක් ගතවේ නම් විදුලි උපකරණයට අදාළ මුළු පොදු කාර්ය පිරිවැය කොපමණද?

03) එක් විදුලි උපකරණයක ප්‍රාථමික පිරිවැය රු:5000 ක් නම් වැය වන මුළු පිරිවැය ගනනය කරන්න

04) පිරිවැයට 10% ක ලාභ සහිතව අලෙවි කරන්නේ නම් විදුලි උපකරණයක විකුණුම් මිල කොපමණද?

**(ලකුණු 10)**

**ආ)** සීමිත නිමාලි පොදු සමාගමේ 2021 මාර්තු මාසයේ සේවකයන්ගේ වැටුප් ගෙවීම් වලට අදාළ තොරතුරු පහත දක්වේ.

1) මාසයක් තුළ වැඩ කළ යුතු සම්මත පැය ගණන 160 කි

2) පැයක මූලික වැටුප රු. 200 කි.

3) අතිකාල පැයක වැටුප මූලික වැටුපෙන් 150% කි.

4) මූලික වැටුප මත සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක්ද ආයතනය 15% ක්ද සේවා නියුක්ති භාර අරමුදලට සේවකයාගේ මූලික වැටුපෙන් 3%ක් දායක විය යුතු ය.

5) සේවක සුභ සාධක සමිතිය වෙනුවෙන් සියලු සේවකයන් මසකට රු: 100 ක් දායක විය යුතුය

6) 2021 මාර්තු මාසයට අදාළ සේවා කාලය පහත පරිදිවේ

| සේවකයා | ගත කළ කාලය |
|---|---|
| ජනිදු | 160 |
| නිසල්මී | 155 |
| බණ්ඩාර | 165 |
| පමුදි | 165 |
| විමන්සි | 150 |

**අවශ්‍ය වන්නේ,**

(1) 2018 මාර්තු මාසය සඳහා වැටුප් ලේඛනය

(2) පොදු ජර්නල් සටහන්

(3) ලෙජර් ගිණුම් පිළියෙල කරන්න. **(ලකුණු 10)**

*****



SPDEXAM2021

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources